අ.පො.ස. උසස් පෙළ

# ව්‍යාපාර අධ්‍යයනය I

Channel NIE

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

ව්‍යාපාර අධ්‍යයනය I — කාලය: පැය දෙකයි

උපදෙස්:

විභාග අංකය :...................................

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

01) විද්‍යුත් ව්‍යාපාර ප්‍රචලිත වීමට බලපාන හේතු කිහිපයක් පහත දැක් වේ. ඉන් එක් හේතුවක් සාවද්‍ය ය. එම පිළිතුර තෝරන්න.
1) මෙහෙයුම් පිරිවැය හා තොග පිරිවැය අඩු වීම.
2) භාණ්ඩ භෞතික ව පරීක්ෂා කොට මිල දී ගැනීමේ හැකියාව ඉහළ යාම.
3) ගෝලීය වූ වෙළෙඳ පොළ අවකාශයක් බිහි වීම.
4) පරිගණක සාක්ෂරතාව වැඩි වීම.
5) ගනුදෙනු ක්‍රියාවලිය වේගවත් වීම.

02) ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| A. අයිතිකරුවෝ | B. ණය හිමියෝ | C. සේවකයෝ | D. පාරිභෝගිකයෝ |
| E. සැපයුම්කරුවෝ | F. විභව ආයෝජකයෝ | G. රජය | H. ප්‍රජාව |
| I. කළමනාකරුවෝ | | | |

ඉහත පාර්ශ්ව අතුරෙන් අභ්‍යන්තර පරිසරය නියෝජනය කරන පාර්ශ්ව ඇතුළත් වරණය තෝරන්න.
1) A,B,C 2) A,D,I 3) B,D,H 4) F,G,H 5) A,C,I

03) තිරසර සංවර්ධනය වඩාත් ම හොඳින් අර්ථ දක්වන ලද ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න.
1) රටක මූර්ත ජාතික නිෂ්පාදනය අඛණ්ඩ වර්ධනය වීම හා රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ යාම.
2) විරැකියාව, ආදායම් විෂමතාව හා දුප්පත්කම සමාජයෙන් ඉවත් වීම නිසා ඇති වන තත්ත්වයකි.
3) අනාගත පරම්පරාවේ අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය උල්ලංඝනය නොකරමින් වර්තමාන අවශ්‍යතා සපුරා ගැනීම මගින් සංවර්ධනය අත්පත් කර ගැනීම.
4) ස්වාභාවික පරිසරය විනාශ කිරීමෙන් තොර ව ඵලදායි වෙනස්කම් කිරීම කරනුයේ කෙසේ ද යන්න පිළිබඳ ව සැලකිලිමත් වෙමින් අනාගත පරපුර වෙනුවෙන් ගෝලීය පරිසරය ආරක්ෂා කිරීම.
5) වර්තමාන ජනතාවගේ අවශ්‍යතා සපුරාලීම මගින් මානව සංවර්ධනය ඇති කිරීම හා අනාගත පරම්පරාවේ අවශ්‍යතා උල්ලංඝනය නො කිරීමට වග බලා ගැනීම.

04) රටක මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී භාවිත කරන උපකරණ කීපයක් පහත දැක්වේ.

A. පොලී අනුපාතිකය
B. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය
C. ණයවර ලිපි මත තායි ආන්තික පැනවීම
D. යහ පෙලඹ වීම හෙවත් ශිෂ්ට ප්‍රයෝග
E. විවට වෙළෙඳපොළ කටයුතු

ඉහත උපකරණ නිවැරදි ව බෙදා දක්වා ඇති පිළිතුර තෝරන්න.

| <u>ගුණාත්මක</u> | <u>ප්‍රමාණාත්මක</u> |
|---|---|
| 1) A,B,C | D,E |
| 2) D,E | A,B,C |
| 3) A,D | B,C,E |
| 4) C,D,E | A,B |
| 5) C,D | A,B,E |

05) පෞද්ගලික අංශයේ මෙන් ම රාජ්‍ය අංශයේ ද දැකිය හැකි ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

1) සමුපකාරය යි.
2) සංස්ථාපිත සමාගම් ය.
3) කේවල ස්වාමි ව්‍යාපාර යි.
4) දෙපාර්තමේන්තු ය.
5) හවුල් ව්‍යාපාර යි.

06) පහත සඳහන් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ අතර ව්‍යවසායකත්ව කුසලතාවක් ද ඇතුළත් ය. එම ව්‍යවසායකත්ව කුසලතාව වන්නේ,

1) නායකත්වය දැරීමට හැකි වීම.
2) ස්වාධීන බවින් යුතු වීම.
3) ආත්ම විශ්වාසය පැවතීම.
4) නිර්මාණශීලි බවින් යුතු වීම.
5) කැපවීම ඉතා ඉහළ අගයක් ගැනීම.

07) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීමට භාවිත කරන ගුණාත්මක නිර්ණායක පමණක් අයත් කාණ්ඩය තෝරන්න.

1) සේවක සංඛ්‍යාව, කළමනාකරණ ශිල්ප ක්‍රමය, නිමවුමේ ස්වරූපය, භාවිත කරන තාක්ෂණය
2) ආයෝජිත ප්‍රාග්ධනය, වාර්ෂික පිරිවැටුම, නිෂ්පාදන ධාරිතාව, සේවක සංඛ්‍යාව
3) ව්‍යාපාර කටයුත්තේ ස්වභාවය, භාවිත කරන තාක්ෂණය, නිමැවුමේ ස්වභාවය, කළමනාකරණ ශිල්පීය ක්‍රම
4) විදුලි බල ධාරිතාව, නිමැවුමේ ස්වරූපය, වෙළෙඳපොළ ස්වභාවය, ආයෝජිත ප්‍රාග්ධනය
5) නිෂ්පාදන ධාරිතාව, සේවක සංඛ්‍යාව, භාවිත කරන තාක්ෂණය, සේවක සමීප සුපරීක්ෂණය

08) ව්‍යාපාරයක් මගින් ලබා ගෙන ඇති රක්ෂණාවරණයක් හා එම රක්ෂණාවරණය මගින් ආවරණය වන විෂය වස්තුව පහත වගුවේ දැක්වේ.

| <u>රක්ෂණාවරණය</u> | <u>රක්ෂිත විෂයය වස්තුව</u> |
|---|---|
| i) මාර්ගස්ත භාණ්ඩ රක්ෂණය | A. නිපදවන භාණ්ඩ |
| ii) ගිනි උවදුරු රක්ෂණය | B. වෑන් රථය |
| iii) සේවා යෝජක වගකීම් රක්ෂණය | C. ප්‍රවාහන භාණ්ඩ |
| iv) නිෂ්පාදිත වගකීම් රක්ෂණය | D. සේවාදායකයින් |

රක්ෂණාවරණය හා රක්ෂිත විෂයය වස්තුව නිවැරදි ව ගැළපූ විට පිළිතුර තෝරන්න.

1) 1-C, 2-B, 3-D, 4-A
2) 1-C, 2-D, 3-B, 4-A
3) 1-D, 2-C, 3-A, 4-B
4) 1-B, 2-D, 3-C, 4-A
5) 1-A, 2-C, 3-D, 4-B

09) ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්ය කිහිපයක් පහතින් දක්වේ.

A. ආර්ථික හා මිල ස්ථායීතාව ඇති කිරීම.
B. මුදල් ප්‍රතිපත්තිය මෙහෙය වීම.
C. මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව ඇති කිරීම.
D. ව්‍යවහාර මුදල් නිකුත් කිරීම.
E. රජයේ මූල්‍ය හා ආර්ථික උපදේශකයා ලෙස කටයුතු කිරීම.

ඉහත ඒවා අතරෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු ද්විත්වය වන්නේ,

1) A හා E ය.
2) B හා D ය.
3) C හා E ය.
4) A හා C ය.
5) D හා E ය.

10) වෘත්තීය පුහුණු අධිකාරිය මගින්, උසස් පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍යයන් සඳහා පැවැත්වීමට නියමිත පරිගණක පාඨමාලාවක් සම්බන්ධව දැනුවත් කිරීම සඳහා රූපවාහිනි මාධ්‍ය යොදා ගෙන දැන්වීමක් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු ප්‍රධානතම කරුණ වන්නේ,

1) පිරිවැය
2) නිවැරදි ව භාෂාව හැසිරවීම
3) හඬ චලන නිසි පරිදි සංයෝග කිරීම
4) සමාජ සංස්කෘතිය
5) ආචාරශීලී වීම

11) පියල් ත්‍රිකුණාමලයේ සිට කොළඹට මාළු ප්‍රවාහනය කොට අලෙවි කරන ව්‍යාපාරිකයෙකි. ඊට සුදුසු ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේ දී නොගැළපෙන කරුණ කුමක්ද?

1) පිරිවැය
2) දුර ප්‍රමාණය
3) භාණ්ඩයේ ස්වභාවය
4) බලය
5) කාලය

12) නිෂ්පාදිත ගබඩා කිරීමත්, නැවත ලබා ගැනීමත් එක ම පැත්තකින් සිදු කෙරෙන පරිදි හෝ නිෂ්පාදිත ගබඩා කිරීම එක් පැත්තකින් ද ඒවා ආපසු ලබා ගැනීම ඊට ප්‍රති විරුද්ධ පැත්තකින් ද සිදු කෙරෙන පරිදි ගබඩාවක භාණ්ඩ ඇසිරීම කළ හැකි ක්‍රමයකි,

1) තට්ටු ඇසුරුම් ක්‍රමය
2) තට්ටු දෙකක් අතර අමතර තට්ටුව
3) පසුපසට තල්ලු කරන රාක්ක
4) ස්වයංක්‍රිය ඇසුරුම් ක්‍රමය
5) එහා මෙහා කළ හැකි තට්ටු සහිත රාමු ක්‍රමය

13) ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිල දී ගැනීමේ දී හෝ විකිණීමේ දී එම ගනුදෙනු තම පෞද්ගලික නමින් සිදු කරණු ලබන නියෝජිතයා,
1) කැපකරු නියෝජිතයා
2) වෙන්දේසිකරු
3) සාධ්‍යකයා
4) තැරැව්කරු
5) කොමිස් නියෝජිතයා

14) යුරෝපීය සංගමය හා G7 කණ්ඩායම යන වෙළෙඳ සංගම්හි සාමාජිකත්වය දරන රටවල් වන්නේ,
1) ජර්මනිය, පිළිපීනය, ජපානය
2) ජර්මනිය, ඉතාලිය, ප්‍රංශය
3) ජර්මනිය, ප්‍රංශය, කැනඩාව
4) ප්‍රංශය, ග්‍රීසිය, ජපානය
5) නෙදර්ලන්තය, ජපානය, ඉතාලිය

15) කළමනාකරණය හා සම්බන්ධ වගන්ති කිහිපයක් පහත දැක්වේ.
1) කාර්යඵල මැනීම හා විචලනය හඳුනා ගැනීම ...(i)...ට අයත් කාර්යයකි.
2) අභිප්‍රේණය හා සන්නිවේදනය ...(ii)...ට අයත් කාර්යයකි.
3) අධිකාරිය හා වගකීම් පැවරීම ...(iii)...ට අයත් කාර්යයකි.
4) පරමාර්ථ හා අරමුණු ස්ථාපිත කිරීම ...(iv)...ට අයත් කාර්යයකි.

ඉහත වගන්තිවල හිස්තැන් පිරවීම සඳහා යොදාගත හැකි සංකල්ප කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| a) කළමනාකරණය | c) අලෙවිකරණය | e) සංවිධානකරණය |
| b) සැලැසුම්කරණය | d) මෙහෙයවීම | f) පාලනය |

i,ii,iii හා iv හිස්තැන් පිරවීම සඳහා ගැළපෙන පිළිතුර අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
1) a,d,e,f
2) f,d,b,c
3) f,d,e,b
4) b,c,d,f
5) e,a,b,d

16) සීමිත විශ්මි ඇපරල්ස් (පෞද්.) සමාගම තම සේවක සේවිකාවන් සඳහා පවත්වන ලද වාර්ෂික සුහද හමුවේ දී එම ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂවරිය විසින් පසුගිය වසරේ විවිධ දක්ෂතා පෙන්වූ සේවක සේවිකාවන් ඇගයීමට ලක් කරමින් ඔවුන්ට ත්‍යාග ප්‍රදානය කරන ලදි.
කළමනාකාර අධ්‍යක්ෂවරිය කටයුතු කළ ප්‍රධාන භූමිකාව හා ඊට අදාළ උප භූමිකාව නිවැරදි ව දැක්වෙන පිළිතුරු තෝරන්න.
1) අන්තර් පුද්ගල භූමිකාව - ප්‍රධානයා
2) තොරතුරු භූමිකාව - තොරතුරු බෙදා හරින්නා
3) තීරණ භූමිකාව - සම්පත් වෙන්කර දෙන්නා
4) අන්තර් පුද්ගල භූමිකාව - නායකයා
5) තීරණ භූමිකාව - ව්‍යවසායකයා

17) අමරස බිස්කට් නිෂ්පාදන ආයතනයේ තොග සම්බන්ධ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- එක් ඇණවුමක් සඳහා පිරිවැය රු. 300 කි.
- ඒකකයක පිරිවැය රු. 100 කි.
- මාසික ද්‍රව්‍ය පරිභෝජනය ඒකක 1000 කි.
- තොග රඳවා ගැනීමේ වාර්ෂික පිරිවැය ඒකකයකට රු. 5 කි.

මෙම ආයතනයේ ආර්ථික ඇණවුම් ප්‍රමාණය වන්නේ,

1) ඒකක 1000 කි.
2) ඒකක 1200 කි.
3) ඒකක 1600 කි.
4) ඒකක 3100 කි.
5) ඒකක 600 කි.

18) නිෂ්පාදන ආයතනයක ගුණත්ව පාලනය හා තොග පාලනය සඳහා භාවිත කෙරෙන ශිල්ප ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A. තත්ත්ව ආරක්ෂණය
B. ABC විශ්ලේෂණය
C. තත්ත්ව කව
D. සංඛ්‍යානමය ක්‍රියාවලි පාලනය
E. ද්විත්ව භාජන ක්‍රමය
F. පරිගණක වැඩසටහන්
G. තොග මට්ටම් නිශ්චය කිරීමේ ක්‍රමය
H. ශුන්‍ය දෝෂ

ඉහත ශිල්ප ක්‍රම අතුරින් ගුණත්ව පාලන ශිල්ප ක්‍රම පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1) A,E,G,H
2) B,D,F,G
3) B,E,G,H
4) A,C,D,H
5) A,D,E,F

19) A හා B අක්ෂරවලින් දැක්වෙන ව්‍යාපාරික සිතුවිලි අදාළ වන අලෙවිකරණ සංකල්ප දෙක අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුරු තෝරන්න.

A. නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය කිරීම වෙනුවට අලෙවි කළ හැකි භාණ්ඩ නිෂ්පාදනය කළ යුතු බව.
B. පාරිභෝගිකයා පෙලඹවීමකින් තොරව නිෂ්පාදිත අලෙවි කළ නොහැකි බව.

1) නිෂ්පාදිත සංකල්පය හා ගනුදෙනුකරු සංකල්පය
2) විකුණුම් සංකල්පය හා නිෂ්පාදන සංකල්පය
3) විකුණුම් සංකල්පය හා අලෙවිකරණ සංකල්පය
4) නිෂ්පාදන සංකල්පය සමාජයීය අලෙවිකරණ සංකල්පය
5) අලෙවිකරණ සංකල්පය හා විකුණුම් සංකල්පය

20) පහත දැක්වෙන්නේ මිහිරි ප්‍රඩක්ට්ස් ආයතනයේ නිෂ්පාදිත මිශ්‍රය යි.

| අයිස්ක්‍රීම් | කිරි පැකට් | බීම | බිස්කට් |
|---|---|---|---|
| වැනිලා | වැනිලා | අඹ | චොක්ලට් |
| චොක්ලට් | | දොඩම් | වේෆස් |
| ස්ට්‍රෝබෙරි | චොක්ලට් | මිශ්‍ර පලතුරු | ක්‍රීම් |
| ෆෘට් ඇන්ඩ් නට් | | | |

ඉහත නිෂ්පාදිත මිශ්‍රයේ දිග, පළල හා සාමාන්‍ය ගැඹුර අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1) 12, 3, 4
2) 3, 12, 4
3) 12, 4, 3
4) 4, 3, 12
5) 4, 4, 3

21) පල්ලෙකැලේ ජාත්‍යන්තර ක්‍රීඩාංගනයේ පැවති ශ්‍රී ලංකාව හා ඕස්ට්‍රේලියාව අතර විස්සයි විස්ස ක්‍රිකට් තරගය නැරඹීම සඳහා අන්තර්ජාලය හරහා ප්‍රවේශපත්‍ර ඇණවුම් කළ ගිහාන් සහ ඔහුගේ මිතුරන් නියමිත දින දුම්රියෙන් නුවරට ළඟා විය.
ඉහත සිද්ධිය තුළ අන්තර්ගත ඉරි ඇඳි පදවලින් ගම්‍ය වන නිෂ්පාදිත, අනුපිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

1) කණ්ඩායම්/තොරතුරු/අදහස්/ස්ථාන
2) ස්ථාන/ඉසවු/ තොරතුරු/සේවා
3) අදහස්/ ඉසවු/ ස්ථාන/ තොරතුරු
4) ස්ථාන/අත්දැකීම්/ඉසවු/සේවා
5) කණ්ඩායම්/සේවා/අදහස්/තොරතුරු

22) කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පතක් වන සාමාන්‍ය කොටස් සම්බන්ධ පහත වගන්ති අතරෙන් එකඟ විය නොහැකි වගන්තිය තෝරන්න.

1) මිල දී ගන්නන්ට සමාගමේ අයිතිකරුවන් විය හැකි වීම.
2) ස්ථිර ලාභාංශ ප්‍රතිශතයක් හිමි නොවීම.
3) ප්‍රාග්ධනය ආපසු ගෙවන විට ප්‍රමුඛත්වය හිමි වීම.
4) සමාගමේ පාලන බලතල හිමි වීම.
5) වාර්ෂික මහා සභා රැස්වීම්වලට සහභාගිවීමට අයිතිය හිමි වීම.

23) ව්‍යාපාරයකට මූල්‍ය සම්පාදනය කර ගත හැකි මාර්ග කිහිපයක් පහත දැක්වේ.

A. කොටස් නිකුත් කිරීම
B. බැංකු අයිරා
C. බැංකු ණය
D. කල් බදු
E. රඳවාගත් ලාභ
F. අතිරික්ත වත්කම් විකිණීම

ඉහත මූල්‍ය සම්පාදන මාර්ග අතරෙන්, බාහිර, දිගුකාලීන හා වක්‍ර මූල්‍ය සම්පාදන මාර්ග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1) A හා B
2) B හා C
3) C හා D
4) D හා E
5) E හා F

24) සේවක දුක්ගැනවිලි හඳුනා ගැනීමේ ක්‍රම හා සේවක දුක්ගැනවිලි විසඳීමේ ක්‍රමවේද කිහිපයක් පහත දැක්වේ.

A. දුක්ගැනවිලි විසඳීමේ විධිමත් ක්‍රියාපටිපාටිය
B. ඉවත්ව යාමේ සම්මුඛ සාකච්ඡා
C. විවෘත දොරටු ප්‍රතිපත්තිය
D. ඒකාබද්ධ කමිටු ක්‍රමය
E. උපදේශනය
F. සේවක ආකල්ප සමීක්ෂණ
G. ඔම්බුඩ්ස්මන්වරයකු පත් කිරීම
H. බේරුම්කරණය
I. යෝජනා පෙට්ටිය

ඉහත ඒවා අතුරින් සේවක දුක්ගැනවිලි විසඳීමේ ක්‍රමවේද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1) A,C,D,E,G,H
2) A,B,D,E,F,G
3) B,C,D,E,G,F,I
4) C,D,E
5) A,B,C,D,E,F,G,I

25) කාර්මික ආරවුලක් නිසා සේවා යෝජකයන්ට ඇති වන බලපෑමක් **නොවන්නේ,**

1) කාර්මික සාමය බිඳ වැටීම නිසා සුහදතාව පළුදු වීම.
2) තරගකරුවන් ප්‍රබල වීම.
3) අදාළ භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම.
4) ආයතනයේ කීර්තිනාමය ඉහළ යාම නිසා ලාභය වැඩි වීම.
5) සේවක අසහනය වැඩි වීම.

26) සේවක වගකීම් හා සේවක යුතුකම් කිහිපයක් පහත දැක්වේ.

A. ආයතනයේ කීර්තිනාමය ආරක්ෂා කිරීම.
B. සංවිධානයේ අරමුණු ඉටුවන පරිදි වැඩ කිරීම.
C. ආයතනයේ වැඩි දියුණුව සඳහා උනන්දු වීම.
D. වැඩ ස්ථානයේ යහපත් ලෙස හැසිරීම.
E. රැකියා ගිවිසුමට අනුව කාර්ය ඉටු කිරීම.
F. ආයතනයේ කීර්තිනාමය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම.

ඉහත සඳහන් දෑ අතරෙන් සේවක වගකීම් පමණක් ඇතුළත් වරණය තොරන්න.

1) A,C,D
2) D,E,F
3) A,C,F
4) A,D,E
5) B,D,E

27) පහත සඳහන් වන්නේ විවිධ නිර්ණායක හා එම නිර්ණායක පදනම් කර ගත් තොරතුරු වර්ගීකරණ වේ.

| නිර්ණායකය | තොරතුරු වර්ගය |
|---|---|
| 1. මූලාශ්‍රය අනුව | A. ගුණාත්මක තොරතුරු, ප්‍රමාණාත්මක තොරතුරු |
| 2. ස්වභාවය අනුව | B. උපාය මාර්ගික තොරතුරු, මෙහෙයුම් තොරතුරු, උපක්‍රමික තොරතුරු |
| 3. කළමනාකරණ ශ්‍රිතය අනුව | C. අභ්‍යන්තර, බාහිර |
| 4. කළමනාකරණ මට්ටම අනුව | D. මූල්‍ය තොරතුරු, මෙහෙයුම් තොරතුරු, අලෙවිකරණ තොරතුරු, මානව සම්පත් තොරතුරු |

ඉහත දී ඇති නිර්ණායක අනුපිළිවෙළ අනුව තොරතුරු වර්ග නිවැරදි ව ගළපා ඇති වරණය කුමක් ද?

1) 1-D, 2-C, 3-A, 4-B
2) 1-A, 2-C, 3-B, 4-D
3) 1-C, 2-A, 3-D, 4-B
4) 1-A, 2-C, 3-C, 4-B
5) 1-B, 2-C, 3-D, 4-A

28) පරිගණක පද්ධති මුහුණපාන අවදානම් අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් **නොවන්නේ,**
1) අගුල් පද භාවිතය. (password)
2) භාවිත කරන්නාගේ නාමය යොදා ගැනීම. (user name or ID)
3) තොරතුරු පිටපත් පිටත ස්ථානයක ගබඩා කිරීම.
4) ජනප්‍රිය සන්නමක් සහිත පරිගණක යොදා ගැනීම.
5) පරිගණක ඒකක සඳහා ආරක්ෂිත දොරගුලු භාවිතය.

29) ව්‍යාපාර සැලැස්මක මූලිකාංග Xවලින් ද, ඒවායෙහි ඇතුළත් කරනු ලබන මූලික තොරතුරු Yවලින් ද පහත වගුවෙන් දක්වේ.

| X | Y |
|---|---|
| A. විධායක සාරාංශය | a. භාණ්ඩ හා සේවා පිළිබඳව |
| B. ව්‍යාපාර විස්තරය | b. කම්හල් පිරියත සැලැස්ම |
| C. මෙහෙයුම් සැලැස්ම | c. තරගකාරිත්ව විශ්ලේෂණය |
| D. අලෙවිකරණ සැලැස්ම | d. තනතුරු හා වගකීම් |
| E. මානව සම්පත් සැලැස්ම | e. දක්ම හා මෙහෙවර |

X හා Y තීරු නිවැරදි ව ගැළපූ විට පිළිතුරු වන්නේ,
1) Ae, Ba, Cb, Dc, Ed
2) Ab, Bc, Cd, Da, Ee
3) Ac, Bb, Cd, Da, Ee
4) Ab, Bc, Cd, De, Ea
5) Ad, Bc, Ca, De, Eb

30) ව්‍යාපාර සැලැස්මක අනිවාර්යයෙන් ම තිබිය යුතු අංගයක් **නොවන්නේ,**
1) ව්‍යාපාර ආයතනය පිළිබඳ විස්තරය
2) මෙහෙයුම් සැලැස්ම
3) අලෙවිකරණ සැලැස්ම
4) පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන
5) මූල්‍ය සැලැස්ම

- **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු *වචනය/වචන* යොදා හිස්තැන් පුරවන්න.**

31) (අ) අමුද්‍රව්‍යයකින් මිනිස් අවශ්‍යතාවක් සැපිරෙන ආකාරයට ම නිමි ද්‍රව්‍යයක් බිහි කිරීමෙන් ................................ බිහි වන අතර හැකියාවක් දක්ෂතාවක් මිනිස් අවශ්‍යතාවන්ට අනුව යොදා ගැනීම මගින් ................................ බිහි වේ.
ආ) ව්‍යාපාරයට සෘජු බලපෑමක් නොකරන එහෙත් කිසියම් සැලකිය යුතු මට්ටමේ බලපෑම් කරන පරිසරය ...................................................... ලෙස ද ව්‍යාපාර පරිසරයට බලපෑම් කරන එහෙත් ව්‍යාපාරයට වෙනස් කළ නොහැකි පරිසරය ......................................... ලෙස ද හැඳින්වේ.

32) (අ) ව්‍යාපාරයක් දිගු කාලයක් සාර්ථක ව පවත්වාගෙන යාමට වර්තමානයේ ඉටු කළ යුතු වැදගත් කාර්යභාරයක් වන්නේ සිය සමාජ වගකීම් මනාව ඉටු කිරීමයි. එම පාර්ශ්ව අතර අයිතිකරුවෝ, සේවකයෝ, ................................. හා ....................................... ප්‍රධාන වෙති.
(ආ) පුද්ගලයන්ගේ හෝ ව්‍යාපාරවල ආදායම, ධනය හෝ වත්කම් මත අයකරන ලබන බද්ද ................................ වන අතර ගෙවන පුද්ගලයා විසින් ම දැරිය යුතු නොවන විතැන් කළ හැකි බද්ද ................................ වේ.

33) (අ) තනි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ දී ................................ සිදු නොවන අතර සමාගමක් ලියාපදිංචි කිරීමේ දී ................................ සිදු වේ.
(ආ) සෑම හවුල්කරුවෙකු ම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු හා ප්‍රධානියෙකු වශයෙන් සැලකීම ................................ වන අතර හවුල්කරුවන් ලාභාලාභ සම සම ව බෙදා ගත යුත්තේ ................................ නොමැති අවස්ථාවක ය.

34) (අ) අතරමැදියන් යනු නිෂ්පාදිත බෙදා හැරීමේ දී ................................ හා ................................ අතර බෙදා හැරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන විවිධ පර්ශ්ව වේ.
(ආ) ආනයනකරුගේ ඉල්ලීම මත, ................................ වෙනුවෙන් ඔහුගේ බැංකුව විසින් අපනයනකරුගේ බැංකුව වෙත ................................ නිකුත් කෙරේ.

35) (අ) කණ්ඩායමේ සාමාජිකයන්ගේ රැකියාවලට සම්බන්ධ කටයුතුවලට මග පෙන්වීමේ හා බලපෑම් කිරීමේ ක්‍රියාවලිය ................................ වන අතර එය ................................ ක්‍රියාවලියට අයත් ප්‍රධාන කාර්යයකි.
(ආ) දැක්ම, මෙහෙවර, පරමාර්ථ, අරමුණු ළඟා කර ගැනීමට කළ යුත්තේ කුමක්ද? යන්න ................................ වලින් පෙන්නුම් කරන අතර ................................ නිශ්චිත කාර්යයක් ඉටු කිරීමට අවශ්‍ය වන සම්පත් හා එය යොදා ගන්නා ආකාරය පිළිබඳ ප්‍රධාන හා උප කොටස්වලට බෙදා විස්තර කෙරෙන්නකි.

36) (අ) ක්‍රියාවලි පිරියතේ දී ................................ නියුක්ත සේවකයෝ එක් ස්ථානයක ස්ථානගත කරන අතර ................................ වටා කාර්යයන් ගලා යන ආකාරයට පිරියත සැලසුම් කරනු ලබයි.
(ආ) යළි ඇණවුම් මට්ටම ගණනය කිරීමේ දී කාලච්ඡේදයනට අදාළ ................................ හා ................................ සැලකිල්ලට ගත යුතු වේ.

37) (අ) ආයතනයක් තමාගේ ම වෙබ් අඩවි, මුහුණු පොත (Facebook) වැනි මාධ්‍යවල සිදු කරන සන්නිවේදනය ................................ ලෙස අදහස් කරන අතර පාරිභෝගිකයන් හෝ ආයතනයට පරිබාහිර පුද්ගලයන් ස්වේච්ඡාවෙන් ආයතනයේ සන්නාම පිළිබඳ කට වචනය, සර්පිලාකාර අලෙවිකරණය (Viral Marketing) වැනි මාධ්‍යය මඟින් කරන සන්නිවේදනය ................................ ලෙස හඳුන්වයි.
(ආ) විද්‍යුත් අලෙවිකරණය හා කැටලොග් මගින් අලෙවිය ................................ සඳහා ද වීදි නාට්‍ය හා ක්‍රීඩා ................................ සඳහා ද යොදා ගැනෙන ක්‍රම කිහිපයකි.

38) (අ) ව්‍යාපාර නවීකරණය පිළිබඳ තීරණ ................................, තීරණ වන අතර වෙළෙඳ තොග පිළිබඳ තීරණ ................................ තීරණයකි.
(ආ) කොළඹ කොටස් හුවමාරුවේ පූර්ණ සාමාජිකයන් ලෙස ................................ ක්‍රියාත්මක වන අතර ඔවුන් කොළඹ කොටස් හුවමාරුවේ ................................ ලෙස කටයුතු කරයි.


39) (අ) රැකියා අපේක්ෂිත පුද්ගලයාගේ කුසලතා, ආකල්ප, ළැදියා, වටිනාකම් හා ප්‍රතිමාන ආදිය මැනීමට ................................ පරීක්ෂණය යොදා ගන්නා අතර, තෝරා ගන්නා පුද්ගලයාට අදාළ රැකියාවේ නිශ්චිත කාර්ය ඉටු කිරීමට ඇති සැබෑ හැකියාව මැනීම සිදු කරනු ලබන්නේ ................................ පරීක්ෂණය මගිනි.
(ආ) වෘත්තිමය ක්‍රියාමාර්ග ලෙස රැකියා ස්ථානයේ ඇති යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට නොහැකි ලෙස දොරගුළු දමා වසා තැබීම හෝ ඒවායේ සුළු කොටසක් ගලවා තැබීම ................................ වන අතර සිය ඉල්ලීම් දිනා ගැනීම සඳහා ව්‍යාපාර ස්ථානය ඉදිරිපිට හෝ පොදු ජනතාව ගැවසෙන ස්ථානයක පෙනී සිටිමින් සේවක පිරිසක් ආහාර පාන ගැනීමෙන් වැළකී විරෝධය දැක්වීම ................................ ලෙස හැඳින්වේ.

40) (අ) ක්‍රියාවලීන්, තාක්ෂණයේ භාවිතයන් හා පරිචයන්ගෙන් (*Practices*) සමන්විත වූ ................................, විධායක උපකාරක පද්ධති ශක්තිමත් කරන අතර මෙම පද්ධති නිර්මාණය කරනුයේ ................................ සඳහා භාවිත කරන දත්ත හා තොරතුරු භාවිත කරමිනි.

(ආ) කර්මාන්තයේ වර්තමාන තත්ත්වය, විකුණුම්, ලාභ, වර්ධන අනුපාත හා වෙනත් ප්‍රවණතා පිළිබඳ ................................ විශ්ලේෂණ මගින් සිදු කෙරෙන අතර නිෂ්පාදිත වර්ගය, විකුණුම් ප්‍රමාණය, ඒකකයක මිල හා වාර්ෂික ආදායම ඇස්තමේන්තු කිරීම ................................ මගින් සිදු කරයි.

- **අංක 41 සිට 50 තෙක් ප්‍රශ්නවලට *නිශ්චිත පිළිතුරු* සපයන්න.**

41) තිරසර සංවර්ධන සංකල්පය දැක්වෙන පහත රූප සටහනේ 1,2,3 හා 4 අවස්ථා නම් කරන්න.




1) ..........................................................................................................................................................

2) ..........................................................................................................................................................

3) ..........................................................................................................................................................

4) ..........................................................................................................................................................

42) පහත වගුවේ දී ඇති ලක්ෂණ අදාළ වන පෞද්ගලික අංශයේ හා පොදු අංශයේ ව්‍යාපාර සංවිධාන **වර්ග එක බැගින්** සඳහන් කරන්න.

| ලක්ෂණ | පෞද්ගලික අංශය | පොදු අංශය |
|---|---|---|
| ලැස්තුගත කළ හැකි | 1) ................................................ | 2) ................................................ |
| නෛතික පුද්ගලභාවයක් නොමැති | 3) ................................................ | 4) ................................................ |

43) ව්‍යවසායකයෙකු නොවන ව්‍යාපාරිකයෙකුට සාපේක්ෂ ව ව්‍යවසායකයෙකු සතු ව පවතින වෙනස්කම් **හතරක්** ලියන්න.

1) ..........................................................................................................................................................

2) ..........................................................................................................................................................

3) ..........................................................................................................................................................

4) ..........................................................................................................................................................

44) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ආයතන භාවිත කරන විවිධ නිර්ණායක කිහිපයක් පහත වගුවේ දැක්වේ. එම නිර්ණායක ඉදිරිපත් කළ ආයතනය නම් කරන්න.

| නිර්ණායකය | ප්‍රකාශයට පත් කළ ආයතනය |
|---|---|
| 1. ස්ථිර සේවක සංඛ්‍යාව 50ට අඩු, | ........................................................................ |
| 2. විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පියර් 50ට අඩු | ........................................................................ |
| 3. සේවක සංඛ්‍යාව 25ට අඩු ව්‍යාපාර | ........................................................................ |
| 4. ආයෝජිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 20ට අඩු | ........................................................................ |

45) රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා පැවතිය යුතු මූලිකාංග **හතරක්** සඳහන් කරන්න.

1) ..........................................................................................................................................

2) ..........................................................................................................................................

3) ..........................................................................................................................................

4) ..........................................................................................................................................

46) කළමනාකරුවෙකුට බලය ලැබෙන මූලාශ්‍ර අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| තනතුර මත ලැබෙන බලය | පුද්ගලයා මත ලැබෙන බලය |
|---|---|
| | |
| | |

47) යන්ත්‍ර ඵලදායිතාව හා ශ්‍රම ඵලදායිතාව වර්ධනය කර ගත හැකි ආකාර **දෙක** බැගින් දක්වන්න.

| යන්ත්‍ර ඵලදායිතාව | ශ්‍රම ඵලදායිතාව |
|---|---|
| | |
| | |

48) අලෙවිකරණ සන්නිවේදන මිශ්‍රයේ ප්‍රධාන ප්‍රවර්ධන උපකරණ **හතරක්** සඳහන් කරන්න.

1) ..........................................................................................................................................

2) ..........................................................................................................................................

3) ..........................................................................................................................................

4) ..........................................................................................................................................

49) මිනිස් බල සැලසුමක අනිවාර්යයෙන් අඩංගු විය යුතු තොරතුරු **හතරක්** දක්වන්න.

1) ..........................................................................................................................................................

2) ..........................................................................................................................................................

3) ..........................................................................................................................................................

4) ..........................................................................................................................................................

50) පහත දැක්වෙන සංකේත මගින් ඇඟවෙන ආයතන කවරේ ද?

1) ...................................................................... 2) ......................................................................

3) ...................................................................... 4) ......................................................................

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

| | |
|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II | කාලයඃ පැය තුනයි |

උපදෙස්ඃ

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

01) පහතින් දී ඇති සිද්ධිය හොඳින් කියවා I හා II කොටස් සඳහා පිළිතුරු සපයන්න.

තම ප්‍රදේශයේ ඇති වන ශීඝ්‍ර සංවර්ධනයත් සමග මිනිසුන්ගේ **අත්‍යවශ්‍ය වූ දයක් සපුරාලීම සඳහා** රුක්ෂාන් ''ඒෂියන් කිචන්'' නමින් භෝජනාගාරයක් විවෘත කරන ලදි. ඒ සමග ම කුඩා බේකරියක් ද ආරම්භ කළේ තම භෝජනාගාරය මෙන් ම ප්‍රදේශයේ ඇති **වෙනත් ආපනශාලා හා කුඩා සිල්ලර වෙළෙඳසැල් ද ඉලක්ක කොට ගෙන ය.** භෝජනාගාරයේ හා බේකරියේ සේවය කිරීම සඳහා මෙන් ම බෙදා හැරීමේ කටයුතු සඳහා **පළපුරුදු සේවකයන්** අට **දෙනෙකු** බඳවා ගැනීමට, **සති අග පුවත්පත් දැන්වීමක්** ද පළ කරන ලදි.

(i) (අ) ඉහත සිද්ධියේ **අත්‍යවශ්‍ය ම දයක් සපුරාලීම** යන්නෙන් කුමන සංකල්පයක් සිහි ගන්වයි ද? රුක්ෂාන් ඒ සඳහා ලබා දෙන්නේ යැයි අපේක්ෂා කළ හැකි දෑවලට නිදසුන් සපයන්න.

(ආ) ඉහත සිද්ධියට අදාළ ප්‍රධාන ව්‍යාපාරය හා අනෙකුත් ව්‍යාපාර භාණ්ඩ හා සේවා ලෙස වර්ග කරන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න.

(ii) (අ) රුක්ෂාන් විසින් ආරම්භ කරන ලද බේකරිය සඳහා ක්‍රියාත්මක වේ යැයි සිතිය හැකි ව්‍යාපාර ක්‍රියාවලිය යෙදවුම් නිමවුම් සටහනක් මගින් පෙන්වා දෙන්න.

(ආ) රුක්ෂාන්ගේ ව්‍යාපාරය හා සම්බන්ධ සිද්ධියේ සඳහන් ව්‍යාපාර සහාය සේවා 2ක් නම් කරන්න.

(iii) "ඔබ, පාසල පිළිබඳ උනන්දු වනවා සේ ම පාසල ද ඔබ පිළිබඳ මෙන් ම වෙනත් පාර්ශ්ව කෙරෙහි ද උනන්දු වෙයි." ඔබ ඇතුළු එම විවිධ පාර්ශ්ව පාසලේ අභ්‍යන්තර හා බාහිර පාර්ශ්ව ලෙස වෙන් කර දක්වන්න.

(iv) "තිරසර සංවර්ධනය යථාර්ථයක් බවට පත් කිරීමට නම් ව්‍යාපාර ප්‍රධාන සාධක තුනක් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය."

(අ) ඉහත සාධක තුන නම් කර ඉන් එක් සාධකයක් තහවුරු කිරීමට ව්‍යාපාරයකට ගත හැකි ක්‍රියාමාර්ග 04ක් නම් කරන්න.

(ආ) පිළිගත් මාධ්‍ය ආයතනයක් සියලු පාර්ශ්වයන්ට යහපතක් සිදු වන අයුරින් ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීමට අපේක්ෂා කරයි. එහි අඩංගු විය යුතු ආචාර ධර්ම හතරක් සඳහන් කරන්න.

(v) රතු ළූණු මිල දී ගැනීමට යාමේ දී සරනිට මුහුණ දීමට සිදු වුයේ අප්‍රසන්න අත්දැකීමකි. රතු ළූණු සියල්ල හොඳ තත්ත්වයේ නොතිබුණ හෙයින් හොඳ තත්ත්වයේ රතු ළූණු තේරීමේ දී කඩහිමියා ඊට එරෙහි විය. සරනි කියා සිටින්නේ සුපිරි වෙළෙඳසැලකින් තමාට අවශ්‍ය දේ අවශ්‍ය ප්‍රමාණයකින් තෝරා ගෙන ඒවා මිල දී ගත හැකි බවයි. කඩහිමියා ඊට සවන් නොදුන් අතර අපහාසාත්මක වාග් ප්‍රහාරයක්ද එල්ල කළේ ය.

(අ) ඉහත සිද්ධිය මගින් සුපිරි වෙළෙඳසැල් ලබා දී ඇති, කඩහිමියා කඩ කර ඇති පාරිභෝගික අයිතිවාසිකම කුමක් ද?

(ආ) සරනිට මුහුණපෑමට සිදු වූ සිද්ධියට එරෙහි ව පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි ආයතන බලධාරීන් දෙදෙනකු නම් කරන්න.

(ලකුණු 02යි)

**(මුළු ලකුණු 20යි)**

02) පහත දැක්වෙන්නේ ජාතික පුවත්පතක සිරස්තලයකි.

(i) "ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්තිමය පොලි අනුපාතිකය ඉහළ නැංවීම නිසා වාණිජ බැංකුවලට ද සිය පොළී අනුපාතියකය ඉහළ නැංවීමට සිදුව ඇත."

(අ) ප්‍රතිපත්තිමය පොලි අනුපාතිකය යනු කුමක් ද? (ලකුණු 02)

(ආ) වාණිජ බැංකු ණය පොළී අනුපාතිය ඉහළ නැංවීම ව්‍යාපාරවලට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ii) සුපිරි වෙළෙඳසැල් සාමාන්‍ය සිල්ලර වෙළෙඳසැල්වලට වඩා පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කටයුතු කරන බව පෙනේ. සාමාන්‍ය සිල්ලර වෙළෙඳ ව්‍යාපාරිකයෙකුට එසේ පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **හතරක්** දක්වන්න. (ලකුණු 02)

(iii) ආර්ථික අර්බුදය පැවති බොහෝ අවස්ථාවල දී සමූපකාර ව්‍යාපාරය සුවිශේෂ මෙහෙවරක් ඉටු කර ඇත.

(අ) සමූපකාර ව්‍යාපාරය හැඳින්වීම සඳහා සුදුසු අර්ථකථනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකාවේ පවතින වර්තමාන අර්බුදකාරී තත්ත්වයට යටතේ පාරිභෝගික වුවමනා සපුරාලීම සඳහා සමූපකාර ව්‍යාපාරය දායක කර ගත හැක්කේ කෙසේ ද? (ලකුණු 02 යි)

(iv) බිස්කට් කර්මාන්තයේ නියැලි සුප්‍රසිද්ධ සමාගම් දෙකක් තනි ආයතනයක් ලෙස කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

(අ) මෙම ව්‍යාපාරය සංයෝජනය වී ඇති ආකාරය නම් කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙසේ සංයෝජනය වීමෙන් සමාගම් දෙකට ම අත්පත් කර ගත හැකි ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි)

(v) (අ) පහත දැක්වෙන ව්‍යාපාර සංවිධාන නාමය ඉදිරියෙන් ව්‍යාපාර සංවිධාන වර්ගය නම් කරන්න.

| ව්‍යාපාරයේ නම | ව්‍යාපාර සංවිධාන වර්ගය |
|---|---|
| විල්සන් සහ සමාගම | |
| නිල්මිණි ස්ටෝර්ස් | |
| සී/ස අරුණළු පොදු සමාගම | |
| සී/ස සඳකැළුම් (පෞද්) සමාගම | |

(ලකුණු 02)

(ආ) රාජ්‍ය සමාගමක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

**(මුළු ලකුණු 20යි)**

03) (i) තම අරමුණ ඉටු වන තෙක් තමන් කරන කාර්යය දැඩි උනන්දුවකින් සිදු කරන චරිත් අන් අයගේ අදහස් මත යැපෙන්නෙකු නො වී තම අදහස් හා හැකියා උපරිම අයුරින් ක්‍රියාත්මක කරමින් තම ව්‍යාපාරයට නායකත්වය දෙයි.

(අ) චරිත්ගේ චරිතයෙන් මතු වන සිද්ධිය තුළ ඇතුළත් ව්‍යවසායකත්ව ගති ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 01)

(ආ) සිද්ධිය තුළ ඇතුළත් චරිත්ගේ ව්‍යවසායකත්ව කුසලතාවක් නම් කරන්න. (ලකුණු 01)

(ඉ) චරිත්ට තම ගති ලක්ෂණ හා කුසලතා තවදුරටත් වර්ධනය කර ගැනීමට ස්වයං ඇගයීමක් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 02)

(ii) පහත දැක්වෙනුයේ සුළු පරිමාණ ව්‍යාපාරිකයන් හතර(04)කගේ ප්‍රකාශන යි.

සිතුමි - මගේ ව්‍යාපාරයට තව ලක්ෂ 20ක් සොයා ගන්න තිබුණා නම් අලුත් භාණ්ඩයක් වෙළෙඳපොළට ඉදිරිපත් කරන්න තිබුණා.

සෙත්මිණ - මම දැනට භාවිත කරන යන්ත්‍ර සූත්‍ර හරිම පැරණි ඒවායි. අලුත් යන්ත්‍ර සූත්‍ර පිළිබඳ දැනුම තිබුණා නම් අපනයනය සඳහාත් භාණ්ඩ නිෂ්පාදනය කරන්න තිබුණා.

නයනජිත් - මම බලාපොරොත්තු වන තරම් ලාභයක් මෙම ව්‍යාපාරයෙන් ලැබෙන්නේ නෑ. මම නිවැරදි ව ආයෝජනය කර තිබේදැයි මට සැක සහිතයි.

රවිශාන් - මට තියන ගැටලුව නිෂ්පාදිතයන් විකුණා ගන්නේ කොහොමද කියන එකයි.

ඉහත සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ගැටලුවලට පිළියම් ලෙස රජය සපයා දෙන පහසුකම් හා ඒවා සපයා දෙන ආයතනය බැගින් නම් කරන්න.

(iii) උසස් පෙළ විශිෂ්ට ලෙස සමත් ව විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා සිටින සුලලිත, දැනුම මිණුම තරගයකින් (i) **රුපියල් මිලියනයක මුදලක්** ජයග්‍රණය කළේය. එම මුදලින් ඔහුට අත්‍යවශ්‍යව තිබූ (ii) **ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් රුපියල් ලක්ෂ දෙකක් ගෙවා මිලට ගත් අතර,** ඔහුගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් පියා විසින් ලබාගෙන තිබූ (iii) **රුපියල් ලක්ෂ තුනක ණය මුදලක් පියවීම සඳහා පියාට මුදල් ලබා දුණි.** ඉතිරි මුදලින් මවගේ මග පෙන්වීම මත සුලලිත හා ඔහුගේ නැගණිය වෙනුවෙන් (iv) **ස්ථාවර තැන්පතු ගිණුම් දෙකක් ආරම්භ කළේය.**

(අ) ඉහත සිද්ධියේ තද කළු අකුරින් මුද්‍රිත මුදලේ කාර්ය අනුපිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ආ) සාමාන්‍ය ඉතිරි කිරීමේ තැන්පතු ගිණුමකට වඩා ස්ථාවර තැන්පතු ගිණුමක මුදල් තැන්පත් කිරීම නිසා සුලලිත සහ ඔහුගේ නැගණියට ලබා ගත හැකි ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) "චෙක්පත් භාවිතය මගින් ගනුදෙනු කිරිම සඳහා වාණිජ බැංකු හඳුන්වා දී ඇති ජංගම ගිණුම් හෙවත් ඉල්ලුම් තැන්පතුවල ඇති මුදල්, චෙක්පත් භාවිතයෙන් තොරව ද ගනුදෙනු කිරීමට වර්තමානයේ ජංගම ගිණුම් හිමියන්ට අවස්ථාව සැලසී ඇත."

(අ) ඉහත ප්‍රකාශය සනාථ කිරීමට කරුණු **දෙකක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

(ආ) ඔබට හිමි ඉතිරි කිරීමේ ගිණුම වෙනුවෙන් බැංකුව මගින් සපයා ඇති පරිගණක මෘදුකාංග පහසුකම භාවිත කර සිදු කළ හැකි ගනුදෙනු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

(v) (අ) ඒකක භාරයකට සම්බන්ධ පාර්ශ්ව නම් කර එම පාර්ශ්ව අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 02)

(ආ) "විද්‍යුත් මුදලින් ගනුදෙනු කිරීමෙන් ගනුදෙනුකරුවන්ට මෙන් ම වෙළෙන්දාටත් සැමවිට ම වාසි හිමි වේ." මෙම ප්‍රකාශයට පක්ෂව හා විපක්ෂව කරුණු **දෙක** බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 02)

**(මුළු ලකුණු 20යි)**

04) (i) (අ) රක්ෂණය ජීවිතයට විවිධ රක්ෂණ ඔප්පුවල දී විවිධාකාරයෙන් බලපායි. පහත වගුවේ රක්ෂණ වර්ග සඳහා දී ඇති අවස්ථාවල දී රක්ෂණීය හිමිකම තිබීම අවශ්‍ය නම් √ ලකුණ ද අවශ්‍ය නොවේ නම් × ලකුණ ද යොදන්න. (ලකුණු 02)

| රක්ෂණ වර්ගය | ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී | වන්දි ලබා ගන්නා අවස්ථාවේ දී |
|---|---|---|
| ජීවිත රක්ෂණය | | |
| සමුද්‍රිය රක්ෂණය | | |
| දේපළ රක්ෂණය | | |

(ආ) මෝටර් රථ රක්ෂණ යටතේ සාකච්ඡා කරන පනත් අවශ්‍යතාව හෙවත් පනත් ඔප්පුව ලෙස සැලකෙන්නේ කුමන රක්ෂණ ඔප්පු වර්ගය ද? (ලකුණු 02)

(ii) (අ) වාචික සන්නිවේදනයෙහි වාසි **හතරක්** ලියන්න. (ලකුණු 02යි)

(ආ) සංඥා හා සංකේත සන්නිවේදන මාධ්‍යයේ අවාසි **හතරක්** ලියන්න. (ලකුණු 02යි)

(iii) වසුන්දරා ට්‍රේඩර්ස් ඇපල් හා මිදි ආනයනය කර දේශීය තොග වෙළෙඳ ව්‍යාපාරවලට අලෙවි කිරීමේ නිරත ව්‍යාපාරිකාවකි. ඇය තම ගබඩාව අධිවේගී මාර්ගයට ආසන්නව සීමිත ඉඩකඩක සංවිධානාත්මක ව පවත්වා ගෙන යන අතර, ගබඩා තුළ ස්ථාන වෙන් කර නියමිත උෂ්ණත්වය තෙතමනය රැකෙන පරිදි පලතුරු අසුරා ඇති අතර ම බෙදා හැරීම වේගවත් කිරීමට ගබඩා තුළ පලතුරු අසුරා එහා මෙහා කිරීම සඳහා උපකරණ ද භාවිත වේ.

(අ) ඉහත සිද්දියට අනුව වසුන්දරා ට්‍රේඩර්ස් තම ගබඩාව ස්ථානගත කිරීමේ දී අවධානය යොමු කර ඇති කරුණු **හතරක්** (04) නම් කර ඒ සඳහා නිදසුන් සිද්ධියෙන් උපුටා ලියන්න. (ලකුණු 02යි)

(ආ) විධිමත් ව ඇසිරීම හා ගබඩාව තුළ එහා මෙහා කිරීමේ උපකරණ භාවිත කිරීම නිසා වසුන්දරා ට්‍රේඩර්ස් ආයතනයට ලබා ගත හැකි ප්‍රයෝජන **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි)

(iv) (අ) නිදහස් වෙළෙඳාම යනු කුමක්දැයි අර්ථ දක්වන්න. (ලකුණු 02යි)

(ආ) නිදහස් වෙළෙඳාමට බලපාන තීරුබදු නොවන බාධා සඳහා නිදසුන් හතරක් ඉදිරිපත් කරන්න. (ලකුණු 02යි)

(v) (අ) විද්‍යුත් වෙළෙඳාමෙහි ව්‍යාපාරිකයාට අත් වන පිරිවැය වාසි මොනවාදැයි නිදසුන් දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 02යි)

(ආ) විදේශ වෙළෙඳාමේ දී පහත අවස්ථා දෙකට අදාළ ව ලබා ගත යුතු ලේඛන දෙක නම් කරන්න.

(a) මත්ස්‍ය නිෂ්පාදිත අපනයනයේ දී යෝග්‍යතාව තහවුරු කිරීම සඳහා

(b) අනතුරකට ලක් වූ මෝටර් රථයක් අපනයනයේ දී එහි වගකීම අපනයනකරු භාර ගන්නා බව තහවුරු කිරීම සඳහා (ලකුණු 02යි)

**(මුළු ලකුණු 20යි)**

05) (i) කළමනාකරණය සංවිධානවල පරමාර්ථ හා අරමුණු සාධනය සඳහා පමණක් නොව පුද්ගලයින්ගේ පරමාර්ථ හා අරමුණු සාධනය සඳහා ද දායක වේ.

(අ) පුද්ගලයින්ගේ පරමාර්ථ හා අරමුණු සාධනය සඳහා කළමනාකරණය දායක වන්නේ කෙසේදැයි කරුණු හතරක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) පරමාර්ථ හා අරමුණු අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ii) සංවිධානයක විධිමත් ව සැකසූ සැලසුම් හා සංවිධානයක් යටතේ නිලධාරින්ගේ හැකියා සම්බන්ධයෙන් තීරණ ගනු ලබන්නේ නායකත්වය විසිනි.

(අ) සංවිධානයකට නායකත්වයේ අවශ්‍යතාව පෙන්වීමට කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)

(ආ) පුද්ගලයකු නායකයෙකු ලෙස පිළිගැනීමට සම්පූර්ණ විය යුතු අනිවාර්යය කොන්දේසි **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි)

(iii) ප්‍රගති මුද්‍රණ සමාගම අභ්‍යාස පොත් මුද්‍රණය හා සඟරා මුද්‍රණය සඳහා අංශ දෙකක් පවත්වා ගෙන යයි. සඟරා මුද්‍රණය අංශය සඳහා මෑතක දී නවීන මුද්‍රණ යන්ත්‍රයක් ද මිල දී ගත් අතර පසුගිය සතිය තුළ එම සමාගමේ පොත් මුද්‍රණය සම්බන්ධ දත්ත පහත දැක්වේ.

| වර්ගය | ඇස්තමේන්තුගත පොත් ගණන | සත්‍ය පොත් ගණන |
|---|---|---|
| අභ්‍යාස පොත් | 10,000 | 10,000 |
| සඟරා | 8,000 | 6,000 |

සඟරා මුද්‍රණ අංශයට අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි වීමට හේතු දක්වමින් එම අංශයේ කළමනාකරු පැවසුවේ එම මුද්‍රණ යන්ත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට ආයතනයේ සිටින සේවකයන් දෙදෙනා ම නිසි පුහුණුවක් නොමැති බැවින් ඉදිරි සතියේ ඔවුන් පුහුණුවක් සඳහා යොමු කිරීමට සැලසුම් කර ඇති බවත් ය.

(අ) පොත් වර්ග දෙකෙහි කාලච්ඡේදයේ විචලන වෙන වෙන ම දක්වන්න

(ආ) සඟරා මුද්‍රණ අංශයේ කළමනාකරු භාවිත කර ඇති පාලන ශිල්ප ක්‍රමය කුමන නමකින් හැඳින්විය හැකි ද?

(ඉ) අපේක්ෂිත නිෂ්පාදන ඒකක ප්‍රමාණය ළඟා කර ගැනීමට සඟරා මුද්‍රණය අංශයේ කළමනාකරුට අනුගමනය කළ හැකිව තිබූ වඩාත් යෝග්‍ය පාලන ශිල්ප ක්‍රමය කුමක් ද?

(ඊ) කළමනාකරණ පාලන ක්‍රියාවලියේ හතර වන පියවර නම් කර ඒ සඳහා නිසුනක් සිද්ධියෙන් උපුටා ලියන්න. ( එක් කොටසකට ලකුණු 01 බැගින් ලකුණු 04)

(iv) (අ) කම්හල් පිරියත සැලසුම් කිරීම යනු කුමක්දැයි හඳුන්වන්න. (ලකුණු 02යි)

(ආ) නිෂ්පාදන අංශයට කම්හල් පිරියත් සැලැස්මක ප්‍රයෝජන කරුණු **හතරක්** මගින් පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

(v) (අ) ප්‍රශස්ත තොගයක් යනු කුමක් ද? (ලකුණු 02යි)

(ආ) ප්‍රශස්ත තොගයක් පවත්වා නො ගැනීමෙන් ආයතනයකට අත්විදීමට සිදුවිය හැකි අහිතකර ප්‍රතිවිපාක **හතරක්** ලියන්න. (ලකුණු 02යි)

**(මුළු ලකුණු 20යි)**

06) (i) (අ) සුජාතා මහත්මිය රෙදි සෝදන යන්ත්‍රයක් මිලට ගැනීමේ අපේක්ෂාවෙන් සිටී. එවැනි යන්ත්‍රයක් ඉහළ ගුණාත්වයකින් යුතුව මිල දී ගැනීමේ අපේක්ෂාව ඉටු කර ගැනීම සඳහා සැලකිය යුතු සාධක කවරේ ද? (ලකුණු 02යි)

(ආ) පහත දක්වෙන්නේ සිරිමල්ගේ හා යශෝදාගේ අයතන දෙකේ නිමැවුම් හා යෙදවුම් පිළිබඳ දත්තයන් ය.

| | සිරිමල්ගේ ආයතනය | යශෝදාගේ ආයතනය |
|---|---|---|
| අමුද්‍රව්‍ය ඒකක | 2000 | 2000 |
| ශ්‍රම පැය | 1500 | 1500 |
| යන්ත්‍ර සූත්‍ර | 1500 | 1500 |
| නිමැවුම | 15000 | 20000 |

ඉහත දත්ත ඇසුරෙන් ආයතන දෙකකි. පහත දෑ ගණනය

a) ද්‍රව්‍ය ඵලදායිතාව

b) ශ්‍රම ඵලදායිතාව

c) යන්ත්‍ර ඵලදායිතාව

d) පූර්ණ ඵලදායිතාව

(ලකුණු 02යි)

(ii) (අ) සඳුන්, කසුන්, චලනි පාවහන් නිෂ්පාදකයෝ වෙති.

| | | |
|---|---|---|
| සඳුන් | - | මම කැමති මෝස්තර අනුව පාවහන් හදලා වැඩි ප්‍රමාණයක් අලෙවි කරන්නයි මගේ අදහස |
| කසුන් | - | මම නම් මගේ පාවහන් හදන්නේ මගේ පාරිභෝගිකයින්ගේ කැමැත්ත අනුව ඔවුන්ගේ පෞද්ගලික මිම් සඳහා |
| චලනි | - | පාවහන් නිපදවන කොට මගේ ගනුදෙනුකරුවන්ගේ වුවමනා, මිල දී ගන්න පුලුවන්කම ගැන සිතලා තමයි නිෂ්පාදනය කරන්නේ. |

ඉහත ව්‍යාපාරිකයන් අනුගමනය කරන අලෙවිකරණ සංකල්ප වෙන වෙන ම දක්වන්න.

(ලකුණු 02යි)

(ආ) පුද්ගලයෙක් රූපවාහිනි යන්ත්‍රයක් මිලට ගැනීමට යාමේ දී අලෙවිකරණ මිශ්‍රය ඇසුරින් සලකා බැලිය යුතු සාධක කවරේ ද? (ලකුණු 02යි)

(iii) සාර්ථක අලෙවිකරණයක් සඳහා අලෙවිකරණ මිශ්‍රයේ වැදගත්වීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

(ලකුණු 04යි)

(iv) වෙළෙඳපොළ අලෙවි වන සිගිති මාරි, බටිති මාරි ළමයින් අතර ජනප්‍රිය වෙමින් පවතින බිස්කට් විශේෂ දෙකකි. නිෂ්පාදන ආයතන දෙකකින් ඉදිරිපත් කරන මෙම බිස්කට් දෙවර්ගය හඳුනා ගැනීමට පාරිභෝගික ජනතාව කිසියම් වෙහෙසක් දරයි.

(අ) මෙම බිස්කට් වර්ග දෙක වෙන්කොට පැහැදිලිව හඳුනා ගැනීමට යොදා ගන්නා උපක්‍රමය අලෙවිකරණයේ දී කුමන නමකින් හැඳින්වේ ද?

(ආ) ඉහත (අ)හි දී පිළිතුරට අනුව පාරිභෝගිකටයන්ට අත් කර ගත හැකි වාසිදායක තත්ත්වයන් **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)

(v) සී/ස සියල් හා සී/ස විමල් සමාගම් දෙකෙහි මූල්‍ය තොරතුරු පහත දැක්වේ.

| | ප්‍රාග්ධන ආයෝජනය (රු.) | විකුණුම් (රු.) | බදු පෙර ශුද්ධ ලාභය (රු.) |
|---|---|---|---|
| සී/ස සියල් සමාගම | 300000 | 600000 | 50000 |
| සී/ස විමල් සමාගම | 150000 | 300000 | 60000 |

(අ) ඉහත සමාගම් දෙකෙහි ශුද්ධ ලාභ අනුපාත ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) ඉහත දත්ත අනුව වඩාත් සාර්ථක ව්‍යාපාරය කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

**(මුළු ලකුණු 20යි)**

07) (i) (අ) කොටස් වෙළෙඳපොළ දර්ශක වන S & P ශ්‍රී ලංකා 20 දර්ශකයට හා සියලු කොටස් මිල දර්ශකයට සාපේක්ෂව මුළු ප්‍රතිලාභ දර්ශකයේ වෙනස පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

(ආ) S & P ශ්‍රී ලංකා 20 දර්ශකය සඳහා සමාගම් තෝරා ගැනීමේ දී පදනම් වන නිර්ණායක මොනවා ද? (ලකුණු 02යි)

(ii) (අ) මුදල් අයවැය ලේඛනයක් හා ව්‍යාපාරයක මුදල් පොතක් අතර පවතින වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) ශ්‍රී ලංකාවේ සංවිධිත මුදල් වෙළෙඳපොළ වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 02යි)

(iii)(අ) "සංවේතන යනු වේතනවලට වඩා වැඩි දෙයකි" පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) සංවේතන කළමනාකරණයේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(iv) (අ) වෘත්තීය ජීවිතය කළමනාකරණය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02යි)

(ආ) සේවක දුක්ගැනවිලි ඇති වීම සඳහා හේතුකාරක **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)

(v) (අ) ව්‍යාපාර සංවිධානවල බහුල ව ම දැකිය හැකි විනය විරෝධී ක්‍රියා හෙවත් විෂමාචාර **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)

(ආ) ආයතනයක සිදු විය හැකි විනය විරෝධී ක්‍රියා සඳහා ගත හැකි විනය ක්‍රියා මාර්ග **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)

**(මුළු ලකුණු 20යි)**

08) (i) (අ) සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ දුර්වල කළමනාකරණය හේතුවෙන් සේවා යෝජකයාට අත් වන අවාසි **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)

(ආ) කාර්මික ආරවුලක් නිසා සේවා දායකයන්ට හා පාරිභෝගිකයන්ට ඇති වන බලපෑම් **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 02යි)

(ii) (අ) තීරණ උපකාරක පද්ධතියක ඇතුළත් ව්‍යුහගත තීරණ හා ව්‍යුහගත නොවන තීරණ යනු කුමක්දැයි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) පරිගණක තාක්ෂණය ඔස්සේ තොරතුරු රූපමය දත්ත, සංඛ්‍යාමය ශ්‍රව්‍යමය හා දෘශ්‍යමය ලෙස දත්ත රැස්කිරීම සැකසීම ගබඩා කිරීම හා බෙදා හැරීම සිදු කරයි. එසේ වාචික, රූපමය, අක්ෂරමය හා අංකමය වශයෙන් භාවිත කරන අවස්ථා සඳහා නිදසුන් සපයන්න. (ලකුණු 02යි)

(iii)(අ) අන්තර්ජාලය මගින් සැපයෙන සේවා අතර කථන පහසුකම් (VOIP) පහසුකම මගින් අදහස් හුවමාරු ක්‍රම ගත හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ආ) ඔබ ශිෂ්‍යයෙකු වශයෙන් අන්තර්ජාලය පරිශීලනයයෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ **හතරක්** දක්වන්න. (ලකුණු 02යි)

(iv) (අ) ව්‍යාපාර සැලැස්මක අන්තර්ගත ව්‍යාපාර විස්තරයෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) ව්‍යාපාර සැලැස්මක ඇති ප්‍රධාන අංගයක් වන විධායක සාරාංශයක ඇති කරුණු 04ක් නම් කරන්න (ලකුණු 02යි)

(v) ව්‍යාපාර සැලැස්ම අනුව ව්‍යාපාර අදහසේ ශක්‍යතාව ඇගයීමේ දී භාවිත කළ හැකි මූල්‍ය නොවන මිණුම්දඬු හතරක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

**(මුළු ලකුණු 20යි)**